# සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රයවලින් හෙළිවන පුරාණ ලංකාවේ අභයදානය (අනුරාධපුර හා පොළොන්නරු යුගය ඇසුරින්)

ප්‍රසාද් කුමාර එම්. ඒ.
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

**සංක්ෂිප්තය**

මෙම පර්යේෂණය "සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රයවලින් හෙළිවන පුරාණ ලංකාවේ අභයදානය" යන මාතෘකාව පදනම් ව සිදු කරන අධ්‍යයනයකි. අනුරාධපුර හා පොළොන්නරු යුගවල දී අභයදානය ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ ව සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රය ඇසුරින් පුළුල් ව සාකච්ඡා කිරීම මෙම අධ්‍යයනයෙන් සිදු කෙරේ. අභයදානය සම්බන්ධයෙන් තොරතුරු ඇතුළත් සාහිත්‍ය හා අභිලේඛන මූලාශ්‍රය හඳුනාගැනීම, ඒවා සියුම් ව අධ්‍යයනය කිරීම, අභයදාන සංකල්පයේ ප්‍රභවය හඳුනාගෙන එය කෙසේ මෙරට තුළ ස්ථාපිත වූයේ ද, මෙරට ක්‍රියාත්මක වූ අභයදානයන්ගේ ස්වරූපය හා ඒවායේ සමාජීය වැදගත්කම හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මේ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීමේ දී ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය යොදා ගන්නා අතර අභිලේඛන මූලාශ්‍රය සම්බන්ධ ව ක්ෂේත්‍ර පරීක්ෂණයක් ඔස්සේ තොරතුරු ලබා ගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ. අභයදාන සංකල්පය මුල්වරට හඳුන්වාදුන් දේශකයාණෝ බුදුරජාණෝ ය. මරණයට කැප වූ සතුන් වෙත අභයදීම කුසල විපාක 10කට හේතු වන බව බුද්ධ භාෂිතය යි. බිම්බිසාර රජු බුදු සසුනේ පැවිදි වූවන්ට සිර-බන්ධනාදි කිසිවක් නොකළ හැක්කැයි ආඥා පනවා ඇත. මෞර්ය අශෝකයන් පස්වන දිල්ලිතොප්රා ලිපියේ සිරකරුවන්ට සහ සතුන්ට අභය දුන් බැව් දක්වා තිබේ. භාරතයේ ප්‍රචලිත අභයදාන සංකල්පය මහින්දාගමනයත් සමග ලංකාවේ ස්ථාපිත වූ අතර මුල් ම අභයභූමිය මිහින්තලා පුදබිම යි. අනුරාධපුර ඉතිහාසය තුළ ආමණ්ඩගාමිණී රජු (ක්‍රි. ව. 12-29), ශිලාකාල රජු (ක්‍රි. ව. 518-532), තුන්වන කාශ්‍යප රජු (ක්‍රි. ව. 718-724) වැනි රජවරුන් විවිධ නීති පනවා සතුන්ට අභය දී ඇත. පොළොන්නරු යුගයේ දී මහාවිජයබාහු රජු සිත්තනරුබිම්බුදල්නාවන්ට හා ඔහුගේ පරපුරෙහි අය විසින් අභය දිය යුතු වරදක් සිදු කළ හොත් ඔවුන්ට අභය දිය යුතු බව පනාකඩුව තඹ සන්නසෙහි දක්වා ඇත. රජු එය සිදු කර ඇත්තේ තමාට කළ උපකාරයට ප්‍රත්‍යුපකාරයක් වශයෙනි. මානාභරණ රජු සිය පුතු උපන් සන්තෝෂයට සිරකරුවන් නිදහස් කිරීම, නිශ්ශංකමල්ල රජු ප්‍රාණීන්ට අභය දුන් බැව් ගල්පොත - හැටදාගේ වැනි ශිලා ලිපිවල සඳහන් වීම සුවිශේෂී අවස්ථා වේ. අභයදාන සංකල්පය බෞද්ධ මුහුණුවරක් සහිත ව රාජ්‍ය අනුග්‍රහය යටතේ මෙරට ක්‍රියාත්මක වූ ආකාරයක් හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පද:** අභයදානය, අභයභූමිය, නිර්භයත්වය, සිත්තනරුබිම්බුදල්නා

**විද්‍යුත් ලිපිනය:** prasadmallawaarachchi85@gmail.com